# වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය

## බෙල්ලන්විල විමලරතන හිමිපාණන් වහන්සේ

ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයට ඇත්තේ දිග ඉතිහාසයකි. එහි තත්ත්වය යන්තමින් හෝ සලකා බැලීම වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ කිසියම් අදහසක් දැක්වීමට ආධාරයක් වෙයි. අතීත පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳව මේවන විට නොඑක් විචාරකයින් අධ්‍යාපනඥයින් හා ඉතිහාසඥයින් විසින් කරුණු සොයා විමසා දක්වා ඇති අදහස් බොහෝය.

"මුලදී ග්‍රන්ථධුරය යනුවෙන් ගැනුණේ ත්‍රිපිටකය ඉගෙනීම හා ඉගැන්වීම පමණය. එහෙත් කල්යාමේ දී මෙම ඡේදයෙහි අර්ථය වඩාත් පුළුල් වී, භාෂාව, ව්‍යාකරණය, තර්කශාස්ත්‍රය, වෛද්‍යවිද්‍යාව හා වෙනත් ශාස්ත්‍ර ද ග්‍රන්ථධුරයෙහි ලා ගැනුණේය. බෞද්ධ ආරාම ශාස්ත්‍ර හා සංස්කෘතියට මධ්‍යස්ථාන විය. භික්ෂූන් ගැමියන්ගේ පටන් රජකුමරා දක්වා හැම කෙනෙකුට ම උගැන්විය යුතු හැම විෂයෙහි ම කෝටිප්‍රාප්ත විය යුතු විය. ඔවුහු මේවා ඉගැන්වූවා පමණක් නොව ඒ පිළිබඳ පොත්පත් ද ලියූහ."[1]

ආචාර්ය වල්පොල රාහුල හිමියන්ගේ ලංකාවේ බුදුසමයෙහි ඉතිහාසය නම් පොතේ සඳහන් මේ කොටසින් ග්‍රන්ථධුරය පිරිමෙහී නියුතු භික්ෂූන්ගේ ආරාමික අධ්‍යාපනයෙහි ස්වරූපය සහ ප්‍රවණතාව කෙබඳුදැයි අනාවරණය කරගත හැකිය. මුලදී භික්ෂූන්ගේ වාසයට වෙන් වූ ආවාසකුටි සඳහා භාවිත කළ පිරිවෙන් ශබ්දය ඒවා ඇසුරේ පැවැත්වෙන අධ්‍යාපනායතනය හැඳින්වීමට යොදා ගත් හෙයින් ආරාමික අධ්‍යාපනය පිරිවෙන් අධ්‍යාපනය බවට පත්විය. ක්‍රි.ව. සිව්වන සියවසේ පටන් පිරිවෙන් අධ්‍යාපනය නමින් අසන්නට ලැබෙන පැරණි ආරාමික අධ්‍යාපනය භික්ෂු නායකත්ත්වයෙන් ආරාමභූමි ඇසුරුකොට පරිණාමයට පත්වූ වග මේ තොරතුරුවලින් සිතා ගත හැකිය.

මෙකී අධ්‍යාපන ක්‍රමය කෙතරම් විශාල ලෙස පැතුරුණු එකක් ද යන බව ප්‍රකට අධ්‍යාපනඥයකු වූ මහාචාර්ය යූ. ඩී. ජයසේකර මහතා ඉපැරණි ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය නම් කෘතියෙන් විස්තරකොට තිබේ. පිරිවෙන් අධ්‍යාපනය ධර්මවිනය, ශබ්දශාස්ත්‍ර වලට පමණක් සීමා නුවූවක් බව ඉන් තේරුම්ගත හැකිය. මෙම ආයතනවල ඉගැන්වූ විෂය මාලාවට ධර්ම විනය මෙන් ම පාළි, සිංහල, සංස්කෘත, ප්‍රාකෘත, දෙමළ වැනි භාෂාන්තර ද වේද, තර්ක න්‍යාය,, වැනි දර්ශනාන්තර ද ගණිත, ජ්‍යොතිෂ, වෛද්‍යශාස්ත්‍රය වැනි විද්‍යා ශාස්ත්‍ර ද, ව්‍යාකරණ, ඉතිහාස, ඡන්දොලංකාරාදී විෂයාන්තර ද අන්තර්ගත වූ බව එම කෘතියෙන් පන්වා දී ඇත.[2] මේ අතර සමන්තපාසාදිකා නම් විනය අටුවාවේ එන පුවතක් අනුව නීති විශාරද භික්ෂූන්ද සිටිබව පෙනේ. එහි එන ගෝදත්ත තෙරුන්ගේ පුවත මේ බව සනාථ කරයි.[3] ලෝහප්‍රාසාදය ඉදිකිරීමට අවශ්‍ය සැලසුම් ඉදිරිපත් කරන ලද්දේ භික්ෂූන්වහන්සේ විසිනි.[4] සැලසුම් නිර්මාණ ශිල්ප පිළිබඳ ප්‍රවීනත්වය ලැබීම මේ අධ්‍යාපනයේ ම අංගයක් වූ බව එයින් පිළිගත යුතුව ඇත.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

ධර්මවිනය ගැඹුරින් හැදෑරීමේ සුවිශේෂ වගකීම හා අවශ්‍යතාව ඇති අධ්‍යාපනය මෙතරම් පුළුල් විෂය මාලාවක් සහිතව විශාල ප්‍රවණතාවකට හේතුව අවශ්‍යයෙන් සොයා බැලිය යුතු කරුණකි. ඉහත සඳහන් ආචාර්ය හිමියන්ගේ සඳහනින් ද එළිදරව් කළ පරිදි ජනතාව දැනුවත් කිරීමේ මීට හේතුවයි. ගැමියාගේ පටන් රජකුමරා දක්වා හැම කෙනෙකුට ම ඉගැන්වී හැම විෂයක් හැදෑරීමේ වගකීම භික්ෂූන්ට ඉවතලිය නොහැක්කක් විය. හැම විෂයක් උගත්හ. හැම විෂයක් ඉගැන්වූහ. හුදෙක් මිනිසුන් දැනුවත් කිරී පුද්ගලික ලාභාපේක්ෂාවෙන් නොවෙයි. තමන්ට බැඳී සිටින තමන් පතක් ම අපේක්ෂා කරන තමන්ගේ රක්ෂණ පෝෂණය සලසන ජනතාවක් කිරීමට ගන්නා වෑයම සාවද්‍ය වූවක් හෝ ආත්මාර්ථයක් නොවන හෙයිනි. පරමාර්ථයක පිහිටා පුළුල් වූ පිරිවෙන් අධ්‍යාපනය රටේ ජනතාවගේ පොදු අ බවට පත් විය. එය කිසිසේත් භික්ෂූන්ට පමණක් වෙන්වූ අධ්‍යාපනයක් අනික් අතට ජනතාව සඳහා වෙන්වූ වෙනත් පොදු අධ්‍යාපනායතනයක් පැවති බවට තොරතුරු සඳහන්වීමක් ද නැත. දැනුවත්කම ලත් බුද්ධිමත් අප රටේ වාසය කළේ මේ ආරාමික අධ්‍යාපනය ම පුළුල්ව පොදු අධ්‍යාපනයේ පරිනත වූ හෙයිනි. ගමත් පන්සලත් අතර ගොඩනැගුණු අනිවාර්ය සංස්කෘති බන්ධනා මෙසේ අන්‍යෝන්‍ය ආරක්ෂාවට හා අභිවෘද්ධියට හේතුවූ හැටි කියාපාන අනිත් අර්ථයයි. ඒ අනුව එකී සමාජ කාර්‍යයෙහි නිරත භික්ෂූන්ට ජන මෙන් ම පාලකයන්ගේ ද අනුග්‍රහය මෙන් ම ගෞරවයද වර්ධනය විය.

මිනිසුන්ගේ ආධ්‍යාත්මික බාහිර පාරිශුද්ධිය සහ මෙලොව පරලොව සලසා දීමට ඔවුන් දැනුවත් කිරීම, බුද්ධිමත් කිරීම හොඳ ම පින්කමක් වන ඔවුන්ට අවශ්‍ය විවිධ විෂයයන්හි ප්‍රවීණත්වය ලැබූ භික්ෂූන්වහන්සේ අත පිරිවෙන් අධ්‍යාපනය ආගම ධර්මයෙන් පරිබාහිර ලෞකික විෂයයන්ගෙන්ද එකක් බව වටහා ගැනීමට කෝට්ටේ රාජධානි සමයෙහි ලියැවුණු හංස සන්දේ සඳහන් කැරගල පද්මාවතී පිරිවෙන් වරුණත් ගිරා සන්දේශයෙහි සඳහන් ගමුවේ විජයබා පිරිවෙන් වැනුමත් වුවද ප්‍රමාණවත්ය. මේ දෙක ම සමකාලීනව පිරිවෙන් නිසා ඒ කරුණු බෙහෙවින් වැදගත්ය. ඓතිහාසිකවූත් සාම්ප්‍රදා පාතික දේශීය අධ්‍යාපනය ඒ පිරිවෙන් වර්ණනා දෙකින් පිළිබිඹු කොට

කෝට්ටේ රාජධානි සමයෙහි අග භාගයෙහි පටන් ඇති වූ විදේශීන්ගේ ආ අපේ එම ජාතික පිරිවෙන් අධ්‍යාපනය නැසී වැනසී යාමට හේතුවිය. පෘතුගීසි, දේසි, ඉංග්‍රීසි ජාතිකයන්ගේ පාලන කාල තුළ භික්ෂූන්ගේ තත්වය මෙන් ම අධ්‍යාපනය වශයෙන් හැඳින්විය යුතු පිරිවෙන් අධ්‍යාපනයේ තත්ත්වයද පරිහා පත්විය. කෙසේ වුවත් නැතිවීගිය පිරිවෙන් අධ්‍යාපනය නැවත කිසියම් ප්‍රමාණ හෝ කලඑළි දක්විය හැකිවූයේ 19 වන සියවසේ අග භාගයේදී විද්‍යෝදය විද්‍යාල මහා පිරිවෙන් දෙක ආරම්භ කිරීමෙන් පසුවය. මහ පිරිවෙන් දෙක ඇසුරෙන් විනය ශබ්දශාස්ත්‍රයන්හි නිපුණත්වය ලබා දිවයිනේ වෙනත් ප්‍රදේශවල පැමිණි පැවිදි පඬිවරු ඒ ඒ ප්‍රදේශ බදවත් තදනුගාමී පිරිවෙන් එක දෙක ඇරඹී මහා සම්ප්‍රදය දෙකකට අයත් පිරිවෙන් අධ්‍යාපනයක් මෙරට ව්‍යාප්තවීම වචන පළකළ නොහැකි තරමේ භාග්‍යයක් විය. මේ පිරිවෙන් අධ්‍යාපනය පොදු අධ්‍යාපනයක් තරමින්නොපිළිගැනුණද ආගමික භාෂා ශාස්ත්‍රීය හා සංස්කෘතික ෂිතතාව සහ අභිවර්ධනයට ජාතික අධ්‍යාපනය තුළින්වත් තවමත් සමවිය

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

තරමේ ඵලදායිතත්වයක් පෙන්වා ඇති බව අපි දනිමු. විශේෂයෙන් ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර, ධර්මවිනය යන අංශවලින් වෙනත් රටවල උසස් අධ්‍යාපනායතන හා සමතැන් ගතහැකි පිරිවෙන් අධ්‍යාපනයෙන් බිහිවූ විශාරද පඬිවරුන්ගේ සේවය කිසිවෙකුටත් අමතක නොකළ හැකිය. භික්ෂු අධ්‍යාපනයෙහි විශේෂත්වය දූරු පිරිවෙන් අධ්‍යාපනය පෙරදිග භාෂා ශාස්ත්‍ර හා ධර්ම විනයෙහි නිපුණ ගැඹුර විශාරද පඬිවරුන් තැනීම නිසා ඒ විෂයයන් පිළිබඳ ලංකාවේ හොඳ ම උගතුන් වන්නේ භික්ෂූන් වහන්සේය යන නොබිඳිය හැකි පොදු විශ්වාසයක් පවා ගොඩනැගුණි. එය විශ්වාස යක් ම නොව සත්‍යයක් ද විය.

පිරිවෙන් අධ්‍යාපනය වර්ධනයට පත්වෙත්ම වරින්වර එහි නොයෙකුත් නවීකරණය කිරීම් ද ඇතිවිය. නවීකරණයවීම කිසිවක් එහි ගැඹුරු උසස් තත්වය හෙළා ගැනීමට නොව කාලීන අවශ්‍යතා සපුරාගැනීමට යොද ගැනීම නිසා පිරිවෙන් අධ්‍යාපනය දියුණු තත්වයකින් පවත්වා ගැනීමට භික්ෂූන්වහන්සේට හැකිවිය. එසේ ම රජයෙන් ලැබුණ ආධාර අනුබල ඇතිවුවත් මදිවුවත් අධිකාරීන් ස්වාධීනව ඒවා නඩත්තු කරගනිමින් ප්‍රාචීන විභාග, වෙනත් ස්වාධීන උපාධි පරීක්ෂා ආදිය ඉලක්ක කොට පිරිවෙන් අධ්‍යාපනය ජීව ගුණයෙන් යුක්ත ඵලදායී ක්‍රගකාරී ස්වරූපයෙන් සමාජ අවශ්‍යතා සපුරාලන පඬිවරුන් බිහි කරන්නක් හැටියට පවත්වා ගත්හ.

කෙසේ නමුත් 1950 දශකය වනවිට පිරිවෙන් අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථාන බවට පත් විද්‍යොදය විද්‍යාලංකාර පිරිවෙන් පාඨමාලා, උපාධි පරීක්ෂා, විභාග නිර්දේශ, ආචාර්යමණ්ඩල යන හැම අංශයකින් ම ලබා තිබුණ උසස් තත්ත්වය අනුව කාලීන අවශ්‍යතා සපුරාලන හැකියාව ඇති උපාධියාරීන් තනන ජාතික විශ්වවිද්‍යාල තත්ත්ව යෙන් පිළිගැනීමට සුදුසු තත්වයක පවත්නා බව පිළිගැනිණි. පිරිවෙනේ අවසාන වර්ෂ 3 ක ශිෂ්‍යයන් උපාධි පන්තිවල අධ්‍යාපනය ලැබීමට සුදුස්සන් බව පිළිගැනිණි. අවසාන වර්ෂයෙන් පසු පණ්ඩිත උපාධි ලබාසිටි සියලුදෙනා උපාධිධාරීන් ලෙස පිළි ගැනිණ. මෙයින් මා අදහස් කළේ පිරිවෙන් අධ්‍යාපනය කෙතරම් උසස් තත්වයකට පත්ව තිබුණේද යන්න පැහැදිලි කිරීමයි. දිවයිනේ පැව ති ප්‍රධාන පෙළේ අනිත් පිරිවෙන් සමූහයත් විශ්වවිද්‍යාල අනුබද්ධිත ආයතන බවට පත්වූ අතර කුඩා පිරිවෙන් අනුබද්ධායතනවල උසස් අධ්‍යාපනයට ලබන සිසුන් තනන ආයතන විය. ය.

පසුකලෙක විශ්වවිද්‍යාල පිළිබඳ අණ පනත්වල සිදුවූ වෙනස්කම් අනුව පිරිවෙන් අධ්‍යාපන පරිපාටියේ පෙරළියක් සිදුවූයේය. පිරිවෙන් අධ්‍යාපනය අවුල් සහගත තත්වයකට පත් නොවීයයි කීමට නුපුළුවන. මේ තත්ත්වයෙන් මිදී උසස් මට්ටමින් පිරිවෙන් පවත්වාගෙන යාමේ අවශ්‍යතාව භික්ෂූන්ට පමණක් නොව ඒ පිළිබඳ උනන්දුවක් දක්වන කාටත් පෙනී ගියේය. පිරිවෙන් විශ්වවිද්‍යාල බිහිවීම පිරිවෙන් අධ්‍යාපනයේ පිරිහීම වූ බව සමහරු කියති. පිරිවෙන් ගැන නොතකා පිරිවෙන් විශ්ව විද්‍යාල අණ පනත් වෙනස්කිරීම ඊට හේතුව බව කියති. මේ පිරිවෙන් පිරිහීමට සමීප හෝ දුරස්ථ හේතු විය හැකිය. පිරිවෙන් අධ්‍යාපනය වැටීගිය බව නම් සැබෑවකි.

පිරිවෙන් අධ්‍යාපනය කලක් මේ රටේ පොදු අධ්‍යාපනය විය. කලක් විශ්ව විද්‍යාල අධ්‍යාපනය තරම් ශක්තිමත්ව පොදු අවශ්‍යතාවලින් බැගරුම් කොටසක් ඉටුකිරීමේ හැකියාව ඇති උගතුන්ගේ අධ්‍යාපනයක් විය. එබන්දක් නැසී වැනසී යාමට ඉඩහැරීම කිසිසේත් යුතුකමක් නොවේ. එය මෙරට දේශීය සංස්කෘතියේ

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

එක් ප්‍රමුඛ අංගයකි. අවශ්‍යතාවකි. මෙය භික්ෂූන්ට වෙන්වූ භික්ෂු අධ්‍යාපනයක නොවේ. මේ නිසා අවුල් වියවුල් වූ පිරිවෙන් අධ්‍යාපනය පුනරුත්ථාපනය කො සුරක්ෂිත කිරීමත් පෝෂණයත් අරභයා 1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනත නීතිගතකොට පණවා තිබේ. අද පිරිවෙන් පවත්වාගෙන යන්නේ මෙ පනත අනුවයි.

පනතේ 1 කොටසේ අංක 3 අ, ආ, ඇ, ඈ වගන්තිවලින් සඳහන්කොට ඇ පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ එක්තරා ප්‍රමාණයකින් අතීත පරමාර්ථ හා සම්බන්ධ කරණය වී තිබීම සතුටට කරුණකි. එකී පරමාර්ථ සාධනය සඳහා පිරිවෙන් වර් තුනකට බෙදෙන බව පෙනේ.එය 3 වන කොටසේ 7 වෙනි වගන්තියෙහි සඳහන් තිබේ. ඒවා නම් (අ) මූලික පිරිවෙන, (ආ) මහ පිරිවෙන සහ (ඇ) පිරිවෙන් විද්‍යා යතනයයි. මූලික පිරිවෙන i–v ශ්‍රේණිවලින් යුක්තවන අතර ශ්‍රේණිගත විෂය මාලාව හදරා අවසන් කරන ශිෂ්‍යයෙක් මහ පිරිවෙනට හෝ පිරිවෙන් විද්‍යායතනයට ඇතුළත්වීමට සුදුසුකම් ලබයි. පනතේ තුන්වන කොටසේ 9 (2) සහ 10 (2) වගන්ති වල මේ බව සඳහන් වෙයි. මේ වන විට පිරිවෙන් ශිෂ්‍යයාගේ දැනුම පොදු අධ්‍යාපනයෙ viii වන ශ්‍රේණියේ ශිෂ්‍යයකුගේ දැනුමට සමානවන බවත් පනතේ 3 වන කොටසෙ 10 (2) වගන්තියෙන් ඒත්තු ගැන්වෙයි. පැරණි පිරිවෙන් අධ්‍යාපනය හා සසඳා බලන විට මෙය ඉතා පහළ මට්ටමකි. මහ පිරිවෙන පැවැත්වෙනුයේ ප්‍රාචීන විභාග සඳහාය ඉහත මට්ටමේ ශිෂ්‍යයන් සඳහා ප්‍රාචීන විභාග පැවැත්වෙන විට එම උපාධිවල තත්ත්වය පිළිබඳව ඇතිවන්නේ කෙබඳු ආකල්පයක්දැයි සිතා බැලීම වටී. ප්‍රාචීන උපාධිධාරීන් විශ්ව විද්‍යාල උපාධිධාරීන්ගේ මට්ටමින් පිළිගත් අතර විශ්ව විද්‍යාල ආචාර්යවරුන් වශයෙන් සේවය කළ බවත් ඔවුන්ගේ දැනුම ඉතා පුළුල් බවත් අපි දනිමු. අද එක්කො එම උපාධියේ තත්වය හැල්ලුවී තිබේ. නැත්නම් ශිෂ්‍යයාට ඒ මට්ටමේ උපාධියකට සුදුසු දැනුමක් පිරිවෙන් අධ්‍යාපනයෙන් නොලැබෙයි. මේ සාධාරණ සැකය ඉවත්කළ යුත්තකි.

පිරිවෙන් අධ්‍යාපනයේ අනන්‍යතාව රැඳී පැවතුනේ එයින් ලැබූ ගැඹුරු දැනුම මතය. ප්‍රාචීන උපාධි ලබා පිරිවෙන් අධ්‍යාපනය අවසන්කළ තැනැත්තා අදල විෂයයන් පිළිබඳ නිරවුල් ගැඹුරු දැනුමක් ඇත්තකු බව අවශ්‍යයෙන් ම පිළිගැනී තිබුණේ ඔවුන්ගෙන් රටට සැසඳෙන අධ්‍යාපන, ශාස්ත්‍රීය, සංස්කෘතික, සමාජයීක මෙහෙයක් ඉටුවූ නිසාය. පිරිවෙන් අධ්‍යාපනය තුළ මේ තත්වය රැක ගත යුතු බව අවධාරණයෙන් පිළිගත යුතුය.

අනිත් අතට මෙ තත්ත්වය රැකගැනීම පිණිස ඉටුවිය යුතු බොහෝ කරුණු ඇති බව අමතක නොකළ යුතුය. අද පිරිවෙන් අධ්‍යාපනය පවත්නේ සැහෙන සංකීර්ණ තත්වයකයි. මෙය නිරවුල් විය යුතුය. එය ජාතික අධ්‍යාපනයේ ම කොටසක් හැටියට විනා වෙන ම කාගේවත් අධ්‍යාපනයක් නොවිය යුතුය. ජාතික අධ්‍යාපනයට අයත් විශ්වවිද්‍යාලවල උපාධිධාරීන් අදල ක්ෂේත්‍රවල සේවා සඳහා ලබන සුදුසුකම් ප්‍රාචීන උපාධිධාරීන්ටත් අදළ ක්ෂේත්‍රයන්හි සේවා සඳහා ලැබිය යුතුය. උපාධිධාරීන් තැනීමට යොදන විධිවිධාන, වියහියදම්, සැලසුම් පිරිවෙන් අධ්‍යාපනය සඳහා මෙන් ම ප්‍රාචීන උපාධිධාරීන් තැනීමටද යෙදිය යුතුය. අද පිරිවෙන් පැවැත්වීම පිළිබඳව ඇති ගැටළු ප්‍රශ්න බොහෝය. ඒ සියල්ලක් සාකච්ඡා කිරීම මෙවැනි ලිපියකින් නොකළ හැකිය.

ධර්ම විනය ශබ්දශාස්ත්‍රඥනය පිළිබඳව භික්ෂූන්වහන්සේ ලබාගෙන තිබුණ සම්භාවනීය තත්ත්වය, ගෞරවය හා අනන්‍යතාව කෙමෙන් වැටී යමින් පවතී. පිරි

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

වෙන් අධ්‍යාපනය පිළිබඳ භික්ෂූන්වහන්සේ දක්වන උදාසීන බව මෙයට එක් ප්‍රධාන හේතුවකැයි සිතමි. වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය භික්ෂූන්වහන්සේ කෙරෙහි වූ අසාමාන්‍ය වියත් බව රැකදීමට කිසිසේත් ප්‍රමාණවත් නොවෙයි. මහාසංඝයාවහන්සේ නිකාය සම්ප්‍රදාය වශයෙන් නොව පොදු සම්මන්ත්‍රණයෙන් යුතුව පිරිවෙන් අධ්‍යාපනය පුනරුත්ථාපනය කොට රක්ෂණ, පෝෂණය කළයුතුය. ඒ සඳහා සුදුසු අවස්ථාවේ අප පසුවන බව පෙන්වීමට පමණක් කරුණු කීපයක් මෙයින් අවධාරණය කරමු.

සාධක සටහන්:

1. රාහුල හිමි වල්පොල– ලංකාවෙහි බුදුසමයෙහි ඉතිහාසය.
2. ජයසේකර යූ. ඩී.– පැරණි ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය.
3. සමන්තපාසාදිකා
4. මහාවංසො (පොල්වත්තේ බුද්ධදත්ත සංස්කරණය 1959) පරි. 27 ගාථා 17–20.
5. 1979 අංක 64 දරණ පිරිවෙන් පනත. ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk